NILIS

s

# පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Library and Information Management (පාඨමාලා කේතය: DLIM)

DLIM 2025/2026

### 1) හැදින්වීම:

වත්මන් තොරතුරු සමාජය තුළ තොරතුරු මනාව කළමණාකරණය කිරීමට පවත්නා හැකියාව ඕනෑම පුද්ගලයෙකුගේ අධ්‍යාපනික, වෘත්තීය සහ පෞද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා වන තීරණාත්මක සාධකයක් වේ. මෙම කාර්යය සඳහා විධිමත් සහ කාර්යක්ෂම පුස්තකාල හා තොරතුරු සේවාවක් පැවැත්ම අත්‍යවශ්‍ය කොන්දේසියක් වන අතර, මෙහිදී පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන්නන්ට පැවරෙන භූමිකාව සුවිශේෂීය. ඔවුන් තොරතුරු යුගයේ අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් තම දැනුම කුසලතා සහ ආකල්ප වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. දැනට පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන සහ එම ක්ෂේත්‍රයට ඉදිරියේදී පිවිසීමට අපේක්ෂා කරන අය තොරතුරු යුගයට ගැලපෙන වෘත්තිකයන් බවට පත් කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට සුදුසු අයුරින් මෙම පාඨමාලාව සැලසුම් කර තිබේ.

### 2) ඉලක්ක කණ්ඩායම:

පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන හෝ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයෙහි රුකියාවක් සඳහා උනන්දුවක් දක්වන ඕනෑම අයකු සඳහා

### 3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්:

- අ.පො.ස (උ.පෙ.) සමත්වීම (පැරණි විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 04 සමත් වීම හෝ නව විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 03 සමත්වීම.)

  **හෝ**
- අ.පො.ස (සා.පෙ.) සමත්වීම <u>**සහ**</u> ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන **මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CPL) / පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CSL) / මහජන පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACPL) / පාසල් පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACSL) / හෝ පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව** (ACL) සමත්ව තිබීම.

### 4) ඉගෙනුම් ඵල:


මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු පාඨමාලාලාභීන්ට

- සංවිධානයක තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීමට
- විවිධ සම්පත්වලින් තොරතුරු කාර්යක්ෂමව ගවේෂණය කිරීමට
- පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයක ලේඛන මනාව කළමනාකරණය කිරීමට සහ
- ඉලෙක්ට්‍රොනික පරිසරයක් තුළ පරිගණක ආශ්‍රිතව තොරතුරු කළමණාකරනය කිරීමටහැකියාව ලැබෙනු ඇත.

### 5) පාඨමාලාවට අන්තර්ගත විෂයන්:

1. පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ හැඳින්වීම
2. එකතු සංවර්ධනය සහ කළමනාකරණය
3. පුස්තකාල සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය
4. තොරතුරු සම්පත් හා සේවා
5. ව්‍යාපෘති වාර්තා සම්පාදනය
6. ලේඛන කළමනාකරණය
7. ප්‍රජා තොරතුරු කළමනාකරණය
8. තොරතුරු නිෂ්පාදන සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම

6. **වැඩසටහනේ වැදගත්කම:** DLIM පාඨමාලාව (ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ - SLQF Level 3) සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූපයේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන පුස්තකාල හා තොරතුරු කළමණාකරණ උසස් ඩිප්ලෝමාව HDLIM (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.




**ACL:** පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
**DLIM:** පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමාව
**DPL:** මහජන පුස්තකාලධිපතිත්ව ඩිප්ලෝමාව
**DSL:** පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමාව
**HDLIM I:** පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමාව I
**HDLIM II:** පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමාව II

7. **පාඨමාලා කාලය:** මාස 12

8. **මාධ්‍ය:** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී)

9. **පන්ති පැවැත්වීම:** දේශන මාර්ගගතව හා නීලිස් ආයතනයේදී පැවැත්වේ.

10. **ඇගයීම් ක්‍රමවේදය:** පැවරුම්, අධ්‍යයන වාරයේ අවසානයේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණය සහ ව්‍යාපෘති වාර්තාවක් මගින් සිසුන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ.

11. **පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට නම්.**
පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට නම් සෑම විෂයයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය.

12. **පාඨමාලා ගාස්තුව :** සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 29000/= කි. (වාරික දෙකකින් ගෙවිය හැකිය)2025
13. **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය** : 2025 ජුලි 04

14. **වැඩසටහන් ආරම්භය:** 2025 අගෝස්තු

15. **අයදුම් කරන ආකාරය**

i. අපගේ වෙබ් අඩවියෙන් (nilis.cmb.ac.lk) අයදුම්පත බාගත කරන්න.
ii. අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න.
iii. උප්පැන්න සහතිකයේ, උ.පෙළ සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ පිටපත් අමුණන්න
iv. මහජන බැංකුව, තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100101191736 දරන ගිණුමට අයදුම්පත් සැකසීමේ ගාස්තුව ලෙස රු.300.00 ගෙවා, රිසිට් පත අයදුම්පතෙහි අදාළ කොටුවේ අලවන්න.
v. **නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2025 ජුලි 04 දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත ලිපිනයට තැපැල් කරන්න.**

"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03"
දුරකථන: 011 2507150 / 0701478619